# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,545—1958 ඔක්තෝබර් 3 වැනි සිකුරාදා—3.10.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## II වැනි කොටස—අධිකරණ

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 455 | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| වස්තුභංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශපත්‍රයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙසින් ප්‍රකාශ කරන්නේ නම් යාපනය, මන්නාරම, වවුනියා-මුල්ලතිව් දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1958 ක්වූ ඔක්තෝබර් මස 20 වෙනි දින පෙරවරු 11 පැය පටන් යාපනය නගර ශාලාවේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එසින් පිටතට යන්ට නුසුළුවන් බවත් මෙසින් සැමදෙනාටම දන්වන්නෙමි. 1958 ක්වූ අගෝස්තු මස 26 වන දින දරන මගේ ප්‍රකාශපත්‍රය මෙසින් අවලංගු කරමි.

ඇම්. ශ්‍රී කාන්තා,<br>උතුරු පළාතේ පිස්කල් වම්ශ.

වර්ෂ 1958ක්වූ සැප්තැම්බර් මස 29 දින,<br>යාපනය පිස්කල් කන්තෝරුවේදිය.

### ප්‍රකාශපත්‍රයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොට ගෙන මෙසින් ප්‍රකාශ කරන්නේ නම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1958 ක්වූ ඔක්තෝම්බර් මස 10 වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යට කී ස්ථානයට යට කී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එසින් පිටතට යන්ට නුසුළුවන් බවත් මෙසින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඇල්. බී. අභයරත්න,<br>ස. ප. පිස්කල් වම්ශ.

වර්ෂ 1958 ක්වූ සැප්තැම්බර මස 23 දින,<br>රත්නපුර පිස්කල් කන්තෝරුවේදිය.

**දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ** වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින** සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාදා පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. **පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා** ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.